**මධ්‍යම පළාත් සභාව**
மத்திய மாகாண சபை
CENTRAL PROVINCIAL COUNCIL

**මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන**

මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල, දෙමළ අධ්‍යාපන හා මුස්ලිම් පාසල් කටයුතු, සංස්කෘතික කටයුතු, ඉඩම්, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා බෙදාහැරීමේ කටයුතු, සංචාරක, ක්‍රීඩා සහ ආයෝජන සම්බන්ධීකරණ වෙනත් අමාත්‍යාංශයන් යටතට නොගැනෙන විෂයන් සම්බන්ධ අමාත්‍යාංශය

**மத்திய மாகாண பிரதான மற்றும் கல்வி**

நிதியும் திட்டமிடலும், சட்டமும் ஒழுங்கும், உள்ளூராட்சி மற்றும் மாகாண நிர்வாகம், மனித வலு, தமிழ் கல்வி மற்றும் முஸ்லிம் பாடசாலை நடவடிக்கைகள், கலாசார விவகாரங்களும், காணி, வர்த்தகமும் வாணிபமும், உணவு விநியோகமும் பகிர்ந்தளிப்பும், சுற்றுலா, விளையாட்டு மற்றும் முதலீடு தொடர்பிணைப்பு, ஏனைய அமைச்சுக்களுக்கு கீழ் சேர்த்துக் கொள்ளப்படாத விடயங்கள் தொடர்பான அமைச்சு

**Central Provincial Chief And Education**

Ministry of Finance and Planing, Law and order, Local Government and Provincial Administration, Man Power, Tamil Education and Muslim Schools Activities, Culture Affairs, Land, Trade and Commerce, Food Supplies and Distribution, Tourism, Sports and Investment Coordination Portfolios which are not taken under any other Ministries

පළාත් සභා සංකීර්ණය, පල්ලෙකැලේ, කුණ්ඩසාලේ
மாகண சபைக் கட்டத் தொகுதி, பல்லேகலை, குண்டசாலை.
Provincial Council Complex, Pallekele, Kundasale.

විද්‍යුත් තැපැල / மின் அஞ்சல்/E-mail : pemcentral@gmail.com
වෙබ් අඩවිය/இ.தளம்/ Website : www.cpcm.lk

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| අමාත්‍යාංශ කාර්යාලය<br>அமைச்சு அலுவலகம்<br>Ministry Office | 081-4481322 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 081-2424938 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br>சிரேஷ்ட உதவி செயலாளர்<br>Senior Assistant Secretary | 081-2424936 | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | 081-2424935 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 0812424938 |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | සීපීසී/සීඑම්එස්/1/29/1/13-2 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2024.10. 01 |

මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින්,
මධ්‍යම පළාතේ සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත,

## <u>මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම</u>

මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙහි ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට අයත් අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු දෙකෙන් එක් තනතුරක් 2024.02.18 දින සිට පුරප්පාඩු වී ඇත. මහනුවර දිස්ත්‍රික් ප්‍රධාන සහකාර තේරීම්භාර නිලධාරීගේ අංක EC/EDR/KDY/PRE/2024/RECR&PROM(42) හා 2024.08.31 දිනැති ලිපිය මගින් ලබා දී ඇති අනුමැතිය පරිදි , පුරප්පාඩුවී ඇති අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා දිවයිනේ සියලුම පළාත්වල අධ්‍යාපන දෙපාර්තමේන්තු යටතේ පවතින ආයතනයන්හි සේවයේ නියුතු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මේ සමග අමුණා ඇති නිවේදනය ප්‍රකාරව සුදුසුකම් සපුරා ඇති මධ්‍යම පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතනයන්හි සහ ජාතික පාසල් ඇතුළු පාසල්වල සේවය කරන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ද දැනුවත් කර, ඔවුන්ගේ අයදුම්පත් 2024.10.14 දිනට පෙර මෙම අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

එච්.එම්. එම්.යූ.බී.හේරත්
ලේකම්
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,
මධ්‍යම පළාත.

පිටපත්-

1. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය - කා.දැ.ගැ.ස.
2. ප්‍රධාන ලේකම්, මධ්‍යම පළාත - කා.දැ.ගැ.ස.
3. ආණ්ඩුකාර ලේකම්, මධ්‍යම පළාත - කා.දැ.ගැ.ස.
4. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, මධ්‍යම පළාත - කා.දැ.ගැ.ස.

මධ්‍යම පළාත් සභාව
மத்திய மாகாண சபை
CENTRAL PROVINCIAL COUNCIL

මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන
මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල, දෙමළ අධ්‍යාපන හා මුස්ලිම් පාසල් කටයුතු, සංස්කෘතික කටයුතු, ඉඩම්, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා බෙදාහැරීමේ කටයුතු, සංචාරක, ක්‍රීඩා සහ ආයෝජන සම්බන්ධීකරණ, වෙනත් අමාත්‍යාංශයන් යටතට නොගැනෙන විෂයයන් සම්බන්ධ අමාත්‍යාංශය
மத்திய மாகாண பிரதான மற்றும் கல்வி
நிதியும் திட்டமிடலும், சட்டமும் ஒழுங்கும், உள்ளூராட்சி மற்றும் மாகாண நிர்வாகம், மனித வலு, தமிழ் கல்வி மற்றும் முஸ்லிம் பாடசாலை நடவடிக்கைகள், கலாசார விவகாரங்களும், காணி, வர்த்தகமும் வாணிபமும், உணவு விநியோகமும் பகிர்ந்தளிப்பும், சுற்றுலா, விளையாட்டு மற்றும், முதலீடு தொடர்பிணைப்பு, ஏனைய அமைச்சுக்களுக்கு கீழ் சேர்த்துக் கொள்ளப்படாத விடயங்கள் தொடர்பான அமைச்சு
Central Provincial Chief And Education
Ministry of Finance and Planing, Law and order, Local Government and Provincial Administration, Man Power, Tamil Education and Muslim Schools Activities, Culture Affairs, Land, Trade and Commerce, Food Supplies and Distribution, Tourism, Sports and Investment Coordination Portfolios which are not taken under any other Ministries

පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ, කුණ්ඩසාලේ
மாகண சபைக் கட்டத் தொகுதி, பல்லேகலை, குண்டசாலை.
Provincial Council Complex, Pallekele, Kundasale.

විද්‍යුත් තැපැල /மின் அஞ்சல்/E-mail : pcmcentral@gmail.com
වෙබ් අඩවිය/இ.தளம்/ Website : www.cpcm.lk

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| අමාත්‍යාංශ කාර්යාලය<br>அமைச்சு அலுவலகம்<br>Ministry Office | 081-4481322 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 081-2424938 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br>சிரேஷ்ட உதவி செயலாளர்<br>Senior Assistant Secretary | 081-2424936 | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | 081-2424935 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 0812424938 |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | සීපීසී/සීඑම්එස්/1/29/1/13-2 | ඔබේ අංකය<br>உ மது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2024.10.01 |

සියලුම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරුන්,

වයඹ/උතුරු මැද/උතුරු/බස්නාහිර/නැගෙනහිර/සබරගමුව/ඌව/දකුණු, පළාත

**මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත්**
**අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම**

මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙහි ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට අයත් අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු දෙකෙන් එක් තනතුරක් 2024.02.18 දින සිට පුරප්පාඩු වී ඇත. මහනුවර දිස්ත්‍රික් ප්‍රධාන සහකාර තේරීම්භාර නිලධාරීගේ අංක EC/EDR/KDY/PRE/2024/RECR&PROM(42) හා 2024.08.31 දිනැති ලිපිය මගින් ලබා දී ඇති අනුමැතිය පරිදි , පුරප්පාඩුවී ඇති අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා දිවයිනේ සියලුම පළාත්වල අධ්‍යාපන දෙපාර්තමේන්තු යටතේ පවතින ආයතනයන්හි සේවයේ නියුතු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මේ සමග අමුණා ඇති නිවේදනය ප්‍රකාරව අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2024.10.14 දින වන අතර එදිනට පෙර සුදුසුකම් සපුරා ඇති ඔබ පළාතේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. මේ සඳහා ඔබ දක්වන සහයෝගය ඉතා අගයකොට සලකමි.

එච්.එම්. එම්.යූ.බී.හේරත්
ලේකම්
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,
මධ්‍යම පළාත.

පිටපත්-
1. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය - කා.දැ.ගැ.ස.
2. ප්‍රධාන ලේකම්, මධ්‍යම පළාත - කා.දැ.ගැ.ස.
3. ආණ්ඩුකාර ලේකම්, මධ්‍යම පළාත - කා.දැ.ගැ.ස.
4. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, මධ්‍යම පළාත - කා.දැ.ගැ.ස.

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් මධ්‍යම පළාත් අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම සඳහා වූ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ පරිපාටිය

**1. සේවා පළපුරුද්ද**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ වසර 03ට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයට අමතරව වන, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයට වසරකට ලකුණු 03 බැගින් හිමි වේ. *උපරිම ලකුණු - 30*

**2. අධ්‍යාපන සුදුසුකම්**

2.1 දර්ශනශූරී උපාධි (PhD) *(ලකුණු - 08)*

2.2 දර්ශනපති උපාධි (M Phil) *(ලකුණු - 06)*

2.3 පළමු පංතිය/ශ්‍රේණියට උසස්වීමේදී සලකා නොබැලූ පශ්චාත් උපාධි (MA, MSc, MBA වැනි) *(ලකුණු - 05)*

2.4 කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීමේදී සලකා නොබැලූ පශ්චාත් උපාධි *(ලකුණු - 04)*

2.5 සේවයට බඳවා ගැනීමට සුදුසුකම වූ ප්‍රථම උපාධියට අමතරව ලබා ඇති ප්‍රථම උපාධි (උදා- LLB, BIT වැනි) *(ලකුණු - 03)*

(මෙහිදී ලකුණු ලබාදෙනු ලබන්නේ, බඳවා ගැනීමේදී සුදුසුකමක් ලෙස සැලකූ උපාධිය, කාර්යක්ෂමතා කඩඉම් නිදහස් කිරීම හා ශ්‍රේණි උසස් කිරීම සඳහා සලකා බැලූ පශ්චාත් උපාධි ඩිප්ලෝමා/පශ්චාත් උපාධි හැර, අනෙකුත් සුදුසුකම් අතරින්, එක් එක් ක්ෂේත්‍රයේ ඉහලම සුදුසුකම් සඳහා පමණි.)

*උපරිම ලකුණු - 08*

**03. ක්ෂේත්‍රයෙහි සේවා පළපුරුද්ද**

අදාළ පත්වීම් බලධාරීන් විසින් නිකුත් කර ඇති විධිමත් පත්වීම් ලිපි සඳහා පමණක් උපරිම ලකුණු සීමාවට යටත්ව ලකුණු ලබා දෙනු ලැබේ.

3.1 පාසල් කළමනාකරණයේ පළපුරුද්ද *(ලකුණු - 05)*
(ශ්‍රී ලං.අ.ප.සේ. සඳහා අනුමත විදුහල්පති තනතුරක එක් වසරකට ලකුණු 01 බැගින්)

3.2 කාර්යාල කළමනාකරණයේ පලපුරුද්ද *(ලකුණු - 10)*
(විදුහල්පති තනතුරක හැර ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ වෙනත් තනතුරක එක් වසරක සේවා කාලයක් සඳහා ලකුණු 01 බැගින්) *උපරිම ලකුණු - 15*

**04. නිර්මාණශීලීත්වය හා වෘත්තීය සංවර්ධනය**

4.1 වෘත්තීය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ

(පශ්චාත් උපාධියට/පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනයට අදාළ වූ පර්යේෂණ/නිබන්ධන සඳහා ලකුණු ලබාදෙනු නොලබන අතර, වෘත්තීය ක්ෂේත්‍රයට අදාළව ප්‍රසිද්ධ සාකච්ඡා මණ්ඩපයකට ඉදිරිපත් කරන ලද විධිමත්ව අවසන් කරන ලද එක් පර්යේෂණ වාර්තාවකට ලකුණු 04 බැගින් උපරිම පර්යේෂණ 02ක් සඳහා ලකුණු දෙනු ලැබේ.)

4.2 ප්‍රකාශයට පත් කර ඇති සඟරා, ලිපි, ප්‍රකාශන ආදිය

(පෙළපොත් හා ඒ ආශ්‍රිත පරිශීලන ග්‍රන්ථ සඳහා ලකුණු ලබාදෙනු නොලබන අතර, අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශන මණ්ඩලය මගින් අනුමැතිය ලද ග්‍රන්ථ සඳහා පමණක් ද පුවත්පත් හා සඟරාවල පළ කර ඇති ලිපි, වාර්තා හෝ ශාස්ත්‍රීය ප්‍රකාශන සඳහා ලකුණු ලබාදීමේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීම සුදුසු යැයි තීරණය කරනු ලබන ප්‍රකාශන සඳහා එක් ප්‍රකාශනයකට ලකුණු 02 බැගින් උපරිම ප්‍රකාශන 02ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.) *උපරිම ලකුණු - 12*

**05. පරිගණක සාක්ෂරතාව පිළිබඳ දැනුම** (ඉහළම සහතිකයට පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.)

5.1 උපාධිය/උපාධි ප්‍රධාන විෂයයක්/පශ්චාත් උපාධි *(ලකුණු - 04)*

5.2 මාස 06ට වැඩි සහතික පත්‍ර/පුහුණු පාඨමාලා/ඩිප්ලෝමා *(ලකුණු - 03)*

5.3 මාස 03ට වැඩි මාස 06 දක්වා සහතික පත්‍ර/පුහුණු පාඨමාලා/ඩිප්ලෝමා *(ලකුණු - 02)*

5.4 සති 02ට වැඩි මාස 03 දක්වා සහතික පත්‍ර/පුහුණු පාඨමාලා (ලකුණු - 01)

*උපරිම ලකුණු - 04*

**06. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව** (ඉහළම සහතිකයට පමනක් ලකුණු ලබාදෙනු ලැබේ.)

6.1 ඉංග්‍රීසි විෂය සහිත උපාධි/ඉංග්‍රීසි මාධ්‍ය උපාධි/ඉංග්‍රීසි මාධ්‍ය පශ්චාත් උපාධි (ලකුණු - 05)
6.2 අ.පො.ස.(උ/පෙළ) ප්‍රධාන විෂයක් ලෙස ඉංග්‍රීසි විෂය සමත් වී තිබීම (ලකුණු - 04)
6.3 වසරක කාලයකට වැඩි ඩිප්ලෝමා පාඨමාලා (ලකුණු - 03)
6.4 මාස 06 හෝ 06ට වැඩි, අවු.01ට අඩු ඩිප්ලෝමා/සහතික පත්‍ර පාඨමාලා (ලකුණු - 02)
6.5 මාස 06ට අඩු - සහතික පත්‍ර පාඨමාලා (ලකුණු - 01)

*උපරිම ලකුණු - 05*

**07. සේවා ඇගයීම්/ප්‍රශංසා සහතික (පොදු 230 බී ආකෘතිය)/සම්මාන සහතික/ජයග්‍රහණ**

7.1 ජාතික මට්ටම - (ලකුණු 10 බැගින් 01ක් පමණක් සළකනු ලැබේ)
7.2 පළාත් මට්ටම - (ලකුණු 04 බැගින් 02ක් පමණක් සළකනු ලැබේ)
7.3 කලාප මට්ටම - (ලකුණු 03 බැගින් 02ක් පමණක් සළකනු ලැබේ)

*උපරිම ලකුණු - 10*

**08. ආයතනික, කළමානාකරණය, පරිපාලනමය, අධ්‍යාපනික කරුණු සම්බන්ධ දැනුම/හැකියාව/අවබෝධය පිරික්සීම**

8.1 ආයතනික කළමනාකරණය හා පරිපාලනය (ලකුණු - 02)
8.2 අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ න්‍යායාත්මක දැනුම (ලකුණු - 02)
8.3 අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ කාලීන ගැටළු හා උපායමාර්ගික යොජනා (ලකුණු - 02)

(අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සම්බන්ධ කරගනිමින් යථෝක්ත කරුණු සම්බන්ධයෙන් පෙර සූදානම් කර ගත් එක් එක් ප්‍රශ්නයට අදාළ ලකුණු සංඛ්‍යාව සඳහන් සමරූපී ප්‍රශ්නාවලි කිහිපයක් අතුරින්, අයදුම්කරු විසින් අහඹු ලෙස තෝරා ගනු ලබන ප්‍රශ්නාවලිය සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.) *උපරිම ලකුණු - 06*

**09. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන සමස්ත කුසලතාව**

9.1 නායකත්වය හා පෞරුෂය (ලකුණු - 04)
9.2 සන්නිවේදන හැකියාව (ලකුණු - 03)
9.3 ආකල්ප (ලකුණු - 03)

*උපරිම ලකුණු - 10*

<u>මුළු ලකුණු 100</u>

..................................... සකස් කලේ

කේ.ඩී.එම්.ජ්.කේ. ඇලිකේවෙල
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය
මධ්‍යම පළාත

කේ. ඩී. එම්. ජී. කේ. ඇලිකේවෙල
නියෝජ්‍ය අධ්‍යක්ෂ (අධ්‍යාපන),
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,
මධ්‍යම පළාත.

..................................... පරීක්ෂා කලේ

පී.මද්දුමආරච්චි
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය
මධ්‍යම පළාත

..................................... අනුමත කලේ

එච්.එම්. එම්.යූ.බී.හේරත්
ලේකම්
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය
මධ්‍යම පළාත

එච්. එම්. එම්. යූ. බී. හේරත්
ලේකම්
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය
පළාත් සභා සංකීර්ණය

**නිවේදනයයි**

**මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත්**

**අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම**

මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්:-**

01. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුයි.

02. ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ සඳහන් I වන හෝ II වන උපලේඛනය යටතේ සිදුකරනු ලැබූ පූර්වාසන්න වසර 5ක වරදකට දඬුවම් නොලැබූ අයෙකු හෝ කිසිදු ආකාරයක විනය කටයුත්තක් පවතින හෝ එවැනි කටයුත්තකට භාජනය වීමට නියමිත අයෙකු හෝ නොවිය යුතුයි.

03. අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට පූර්වාසන්න වසර 05ක් තුළ නියමිත පරිදි වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු අතර, සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුයි.

04. අයදුම්පත් කැඳවන දිනට තනතුරට බඳවා ගැනීම සඳහා වන ඉහත සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

**සටහන :-**

සුදුසුකම් සනාථ කෙරෙන සියලුම අධ්‍යාපන හා වෙනත් සහතිකවල සහතික කල ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතුයි.

**තෝරා ගැනීමේ ක්‍රමය :-**

මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීම මගිනි (අදාළ ලකුණු ලබා දීමේ පටිපාටිය ඇමුණුම 02 ලෙස ඇතුළත් කර ඇත).

**අයදුම්පත් ඉදිරිපත් කිරීම :-**

අයදුම්පත් **www.cmcp.gov.lk** යන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියෙන් ලබාගත හැක. සියලුම අයදුම්පත් විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර 2024.10.14 දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව සකස් කර **"ලේකම්, ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය, මධ්‍යම පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ."** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **" මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම."** යනුවෙන් සඳහන් කළ යුතුයි. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම සම්බන්ධ කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය භාරගනු නොලැබේ.

එච්.එම්. එම්.යූ.බී.හේරත්
ලේකම්
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,
මධ්‍යම පළාත.

# ආදර්ශ අයදුම් පත්‍රය

## මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

01.මුලකුරු සමග නම ( මයා/මිය/මෙනෙවිය) -

02. i.දැනට දරණ තනතුර -

ii.සේවය හා ශ්‍රේණිය -

iii.වත්මන් සේවා ස්ථානය හා ලිපිනය -

03. පෞද්ගලික ලිපිනය -

04. ස්ත්‍රී / පුරුෂ භාවය -

05. i. උපන් දිනය -

ii. 2024-10-14 දිනට වයස -

06. ජාතික හැඳුනුම්පත් අංකය -

07. දුරකථන අංකය - i. පෞද්ගලික ii. රාජකාරී -

08. අධ්‍යාපන සුදුසුකම් -

------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

09. වෘත්තීය සුදුසුකම් -

------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

10. රාජ්‍ය සේවයේ මුල්පත්වීමේ සිට 2024 - 10 - 14 දින දක්වා සේවා කාලයට අදාළ විස්තර -

| අනු අං. | දරණ ලද තනතුර | අයත් සේවාව | ආයතනය | කාලය | |
|---|---|---|---|---|---|
| | | | | සිට | දක්වා |
| | | | | | |
| | | | | | |
| | | | | | |

11. හදාරා ඇති දේශීය / විදේශීය පුහුණු පාඨමාලා පිළිබඳ විස්තර -

| අනු අං. | හදාරා ඇති පුහුණු පාඨමාලාව | ආයතනය | කාල සීමාව | දේශීය / විදේශීය යන වග |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

12. රාජකාරි ආවරණය කිරීම / වැඩ බැලීම පිළිබඳ විස්තර -

| අනු අං | රාජකාරි ආවරණය / වැඩ බැලීම සිදු කළ ආයතනය | රාජකාරි ආවරණය ද / වැඩ බැලීම ද යන වග | රාජකාරි ආවරණය / වැඩ බැලීම සිදු කල කාල සීමාව |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

13. රාජකාරි කටයුතු වලට අමතරව මාගේ විෂය ක්ෂේත්‍රය තුළ විසින් සිදු කර ලද විශේෂිත ක්‍රියාකාරකම් , ව්‍යාපෘති, වැඩසටහන් හා බාහිර වෘත්තිය ක්‍රියාකාරකම් -

14. මවිසින් පළකර ඇති ශාස්ත්‍රීය ප්‍රකාශන / පුවත්පත් / සඟරා වලට සපයා ඇති ලිපි සම්බන්ධ විස්තර -

15. රාජ්‍ය සේවය තුළ ලැබී ඇති සුවිශේෂී කාර්ය සාධන ඇගයීම්/ප්‍රශංසා පිළිබඳ විස්තර -

මට විරුද්ධව දැනට විනය පරීක්ෂණයක් නොපැවැත්වෙන බවත්, ආයතන සංග්‍රහයේ 11 වන කාණ්ඩයේ සඳහන් 1වන හෝ 11වන උපලේඛනය යටතේ සිදු කරනු ලැබූ වරදකට දඬුවම් නොලැබූ අයෙකු බවත්, ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි ඒවා බවත් මෙයින් සහතික කරමි.

දිනය - ----------------------------------------

----------------------------------------------

අයදුම්කරුගේ අත්සන.

---

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය -:

------------------------------------------------------------------------ මයා /මිය/මෙනෙවිය විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු නිලධාරියාගේ/ නිලධාරිනියගේ පෞද්ගලික ලිපි ගොනුව පරීක්ෂා කර බැලූ බවත්, ඒ අනුව එම තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර, මෙම නිලධාරියා/ නිලධාරිනිය විසින් 2024.10.14 දිනට පූර්වාසන්න පස් වසරක කාල සීමාව තුළ නියමිත වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, කිසිදු විනයානුකූල දඬුවමක් ලබා නොමැති බවත්, මෙම අයට විරුද්ධව යම් විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් හා ඉදිරියේදී එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීමට අදහස් නොකරන බවත් සහතික කරමි. මෙම නිලධාරියා/ නිලධාරිනිය තෝරා ගනු ලැබුව හොත් නිදහස් කිරීමට එකඟ වෙමි.

දිනය - ------------------------

------------------------------------

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව